# Project 273
# 273 වන ව්‍යාපෘතිය

DP EDUCATION Coding School




thunkable




LIVEWORKSHEETS

- රෝග පිළිබඳ විස්තර ලබා ගැනීමට App එකක් නිර්මාණය කරමු.
- එහි design එක සඳහා screen 5ක් අවශ්‍ය වේ.
- Screen 1 සඳහා column 1ක් සහ row 2ක් drag කර ඔබට කැමති images යොදා පහත රූපයේ පරිදි screen එක සකසා ගන්න.




- Screen 2 හි විස්තර අවශ්‍ය රෝගයෙහි නම ඇතුළත් කිරීම සඳහා පහත රූපයේ පරිදි text inputs, labels සහ button යොදා අලංකාරවත්ව screen එක සකසා ගන්න.





LIVEWORKSHEETS

- Screen 3 හි රෝග පිළිබඳ විස්තර අඩංගු pdf document එක පෙන්වීම , මාතෘකාව පෙන්වීම , rating අගය පෙන්වීම සහ home එකට යාමට අවශ්‍ය button පෙන්වයි.
- ඒ සඳහා අවශ්‍ය පරිදි row සහ column drag කරන්න. pdf document එක පෙන්වීම සඳහා user interface හි pdf viewer component drag කරන්න. rating අගය පෙන්වීම සඳහා user interface හි rating component drag කරන්න.
- මාතෘකාව සඳහා heart diseases ලබා දෙන්න.
- ඒ වගේම පෙන්විමට අවශ්‍ය pdf files අප විසින් සාදාගත යුතුවේ. ඒ සඳහා chatgpt වැනි ක්‍රමවේදයක් භාවිතා කර heart diseases, kidney diseases සහ liver disease යන මාතෘකා සඳහා විස්තර ලබාගෙන pdf නිර්මාණය කරගන්න.





- ඉහත ආකාරයෙන්ම අනෙකුත් screen දෙක සඳහාද design එක සිදුකරන්න. මාතෘකා සඳහා heart diseases, kidney diseases සහ liver diseases ලබා දෙන්න .
- App එක run කරන අවස්ථාවේ දි විස්තර අඩංගු screens හි ඉහළින් rating ප්‍රමාණය star ලෙස පෙන්වන අතර අපට අවශ්‍ය rating එකක් ලබා දිය හැක.
- එම screens 3 හි pdf viewers සඳහා කලින් නිර්මාණය කරගත් pdf upload කරගන්න.

LIVEWORKSHEETS





- තවද screen 2 හිදී input ලෙස ලබාදෙන value save කර ගැනීම local storage component drag කරන්න.

- දැන් අපි block හි අදාල codes නිර්මාණය කරගමු.
- Screen 1- මෙහි 3 sec රැඳිසිට මීලග පිටුවට යාමට පහත පරිදි codes යොදන්න.





- Screen 2 - මෙහි text input හි enter කරන values button click කළ විට local storage හි save කර ගත යුතුවේ.
- ඒ සඳහා when button click do block drag කර ඒ තුළට call Local_storage1 's save block drag කර value ලෙස text_input 's Text ලබා දෙන්න.

LIVEWORKSHEETS




❖ local storage හි save කරගත් අගය නැවත ලබාගැනීමට (get) ඒ තුළට call Local_storage1 'Local_storage1 's get block drag කරන්න.

❖ එහි then do තුළට අප text_input හි ඇතුළත් කරන value එක heart වචනයට සමානයි නම් screen 3 ට යාමටත්, kidney වචනයට සමානයි නම් screen 4 ට යාමටත් සහ liver වචනයට සමානයි නම් screen 5 ට යාමටත් if do else if do block එකක් drag කර පහත පරිදි block යොදන්න.




LIVEWORKSHEETS

❖ Screen 3 home button මත click කළ විට screen 2 ට යාමට  පහත පරිදි block යොදන්න.




❖ මේ ආකාරයටම Screen 4 සහ Screen 5 blocks යොදන්න.

